අරමුදල් කළමනාකරුගේ සමාලෝචනය

ආර්ථික සමාලෝචනය

2025 වසර ගෝලීය ආර්ථික හා භූ දේශපාලනික වර්ධනයන් රැසකින් හැඩගැසුණු වසරක් විය. උද්ධමන පීඩන ක්‍රමයෙන් ලිහිල් වීම හමුවේ ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා ප්‍රධාන මහ බැංකු කිහිපයක්ම ලිහිල් මුදල් ප්‍රතිපත්ති අනුගමනය කරමින් සිටි අතර, ඒ අනුව මුදල් ප්‍රතිපත්තිවල අඛණ්ඩව වෙනස්කම් සිදු විය. විශේෂයෙන් එක්සත් ජනපදයේ බැඳුම්කර වෙළෙඳපොළ තුළ අස්ථාවරත්වය අඛණ්ඩව පැවති අතර, ආයෝජකයන් රාජ්‍ය මූල්‍ය හිඟය, ණය තිරසාරභාවය සහ උද්ධමන අපේක්ෂා පිළිබඳව අවධානය යොමු කළහ. භාණ්ඩ වෙළෙඳපොළ තුළ, මධ්‍යස්ථ ඉල්ලුම් වර්ධනය සහ OPEC සංවිධානයට අයත් නොවන රටවල අඛණ්ඩ නිෂ්පාදනය හේතුවෙන් තෙල් මිල සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතුණි. විශේෂයෙන් එක්සත් ජනපදය සහ ඉරානය අතර භූ දේශපාලනික ආතතීන් ඉහළ මට්ටමක පැවති අතර, රාජ්‍යතාන්ත්‍රික සාකච්ඡාවල සැලකිය යුතු ප්‍රගතියක් නොමැති වීම ගෝලීය අවිනිශ්චිතතාව තවදුරටත් ඉහළ නැංවීය.

2025 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකය පෙර වසරට සාපේක්ෂව 5.0%[1]ක වර්ධනයක් වාර්තා කළ අතර, ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනෙහිම පුළුල් පදනමක් සහිත වර්ධනයක් ඒ සඳහා සහාය විය. මෙම වර්ධනයට ප්‍රමුඛ දායකත්වය කාර්මික අංශයෙන් ලැබුණු අතර, එම අංශය 7.8%[1]ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ඊට අනතුරුව සේවා අංශය **3.3%**[1]ක වර්ධනයක් වාර්තා කළ අතර, කෘෂිකාර්මික අංශය 1.4%[1]ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. ශක්තිමත් සංචාරක ක්‍රියාකාරකම් සහ විදේශගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ගලා ඒම් හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ නැංවුණු අතර, එමඟින් මෙම වර්ධන වේගය තවදුරටත් ශක්තිමත් විය. ඒ අනුව, වසරේ අවසන් භාගයේදී "ඩිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ බාධා මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා ආර්ථිකය ඉහළ ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළේය.

2025 වසරේදී දේශපාලන පරිසරය ස්ථාවරව පැවති අතර, 2024 වසරේ පැවති මැතිවරණවලින් අනතුරුව රජය ප්‍රධාන ප්‍රතිපත්ති හා ආර්ථික ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යාම අඛණ්ඩව සිදු කළේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) විස්තීරණ අරමුදල් පහසුකම (Extended Fund Facility – EFF) යටතේ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හේතුවෙන් රටේ සාර්ව ආර්ථික රාමුව තවදුරටත් ශක්තිමත් විය. ශ්‍රී ලංකාව සිය වැඩිදියුණු වූ ණය ශ්‍රේණිගත කිරීමේ තත්ත්වය අඛණ්ඩව පවත්වා ගත් අතර, Fitch Ratings ආයතනය ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම

CCC+ මට්ටමේ පවත්වාගෙන ගියේය. මෙය ණය තිරසාරභාවය, රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය සහ ආයෝජක විශ්වාසය අඛණ්ඩව වැඩිදියුණු වෙමින් පැවතීම පිළිබිඹු කරයි.






Index of Industrial Production
105
100
95
90
85
80
Jan 2025
Feb 2025
Mar 2025
Apr 2025
May 2025
June 2025
July 2025
Aug 2025
Sep 2025
Oct 2025
Nov 2025
Dec 2025


Petrol and Diesel Sales - (000 MT)
170
160
150
140
130
120
110
100
Jan 2025
Feb 2025
Mar 2025
Apr 2025
May 2025
June 2025
July 2025
Aug 2025
Sep 2025
Oct 2025
Nov 2025
Dec 2025
Petrol sales
Diesel sales



සී.ටී. ස්මිත් ඇසෙට් මැනේජ්මන්ට් විසින් නිරීක්ෂණය කරන ලද ඉහළ සංඛ්‍යාත ආර්ථික දත්ත (High Frequency Data) මඟින් ධනාත්මක ප්‍රවණතාවක් පෙන්නුම් කරයි.

පොලී අනුපාත පරිසරය

2025 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව සිය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගෙන ගියේය. ඒ අනුව, එක්දින ප්‍රතිපත්ති අනුපාතය (Overnight Policy Rate – OPR) 2025 මැයි මාසයේදී පදනම් අංක 25කින් (25 bps) අඩු කර 7.75%[2]දක්වා පහත හෙළන ලද අතර, උද්ධමනය නැවත ධනාත්මක මට්ටමකට පැමිණ මධ්‍ය කාලීන ඉලක්කය වෙත ළඟා වෙමින් පැවතීම හේතුවෙන් එම අනුපාතය වසර පුරාම එම මට්ටමේ පවත්වා ගන්නා ලදී. ලිහිල් මුදල් ප්‍රතිපත්තියේ බලපෑම පිළිබිඹු කරමින්, රාජ්‍ය සුරැකුම්පත් සඳහා වන පොලී අනුපාත ඇතුළුව වෙළෙඳපොළ පොලී අනුපාත 2025 වසර තුළ සමස්තයක් ලෙස පහළ මට්ටම් වෙත ගැළපුණි. කෙසේ වෙතත්, වසරේ අවසන් භාගයේදී කෙටි කාලීන පොලී අනුපාතවල යම් අසාමාන්‍යතා නිරීක්ෂණය වූ අතර, එය ඩිට්වා සුළි කුණාටුවෙන් පසු ප්‍රතිසාධන කටයුතු සඳහා රජයේ ණය ගැනීම් ඉහළ යනු ඇතැයි පැවති අපේක්ෂාවන් හේතුවෙන් ඇති වූවක් විය හැකිය. ඒ අනුව, වසර අවසානය වන විට දින 91, දින 182 සහ දින 364 කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ පොලී අනුපාත පිළිවෙළින් 7.74%[2], 8.27%[2] සහ 8.45%[2] ලෙස පැවතුණි.

2025 වසර තුළ දේශීය මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය යම් යම් උච්චාවචනයන් සහිතව වුවද, සමස්තයක් ලෙස අතිරික්ත මට්ටමක පැවති අතර, එයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම් සහාය විය. ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම සහ වාහන ආනයනය සඳහා වූ ඉල්ලුම ඉහළ යාම හේතුවෙන්

පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 2.1කින්[2] ඉහළ ගොස් ඇති අතර, එය 2024 වසරට සාපේක්ෂව 25.2%[2]ක වර්ධනයක් නියෝජනය කරයි.





උද්ධමනය

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI, 2021 = 100) මඟින් මනිනු ලබන ශීර්ෂ උද්ධමනය (Headline Inflation), පෙර වසරේ පැවති අවධමනකාරී තත්ත්වයෙන් අනතුරුව, 2025 වසර තුළ ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළේය. වසරේ මුල් මාස කිහිපය තුළ

උද්ධමනය සෘණ අගයක පැවති අතර, එයට ප්‍රධාන වශයෙන් මන්දගාමී ඉල්ලුම සහ බලශක්ති හා ප්‍රවාහන මිල ගණන් පහළ යාම හේතු විය. කෙසේ වෙතත්, වසරේ දෙවන භාගයේදී අවධමනකාරී පීඩන ලිහිල් වීම, විදුලි ගාස්තු වැනි පරිපාලිත මිල ගණන්වල සිදු කළ සංශෝධන සහ හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම් හේතුවෙන් උද්ධමනය යථා තත්ත්වයට පත්වීම ආරම්භ විය. ඒ අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) යන දර්ශක දෙකම මත පදනම් වූ උද්ධමනය ධනාත්මක අගයක් ගනිමින් වසර අවසානය වන විට ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2025 දෙසැම්බර් වන විට CCPI මත පදනම් වූ ශීර්ෂ උද්ධමනය 2.1%[2] පමණ මට්ටමක ස්ථාවර වූ අතර, NCPI මත පදනම් වූ ශීර්ෂ උද්ධමනය 2.9%[2] දක්වා ඉහළ ගියේය. සැපයුම් බාධා සහ සෘතුමය ඉල්ලුම හේතුවෙන් ආහාර මිල ගණන් සම්බන්ධයෙන් තාවකාලික පීඩන කිහිපයක් පැවතියද, 2025 වසර පුරා සමස්ත උද්ධමනය මධ්‍යස්ථ මට්ටමක පැවති අතර, 5%[2]ක් වූ මධ්‍ය කාලීන උද්ධමන ඉලක්කයට වඩා සැලකිය යුතු ලෙස පහළ මට්ටමක පැවතුණි.





විදේශීය අංශයේ කාර්යසාධනය (බාහිර අංශය)

2025 වසරේදී ශ්‍රී ලංකාවේ බාහිර අංශය සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ අතර, විදේශගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ, සංචාරක කර්මාන්තය සහ සේවා අපනයනවලින් ලැබුණු ඉහළ ගලා ඒම් ඊට ප්‍රධාන වශයෙන් සහාය විය. වසර තුළ ජංගම ගිණුම ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 1.7ක[2] අතිරික්තයක් වාර්තා කළ බවට ඇස්තමේන්තු කර ඇති අතර, වෙළෙඳ භාණ්ඩ අංශය තුළ අඛණ්ඩව පැවති අභියෝග මධ්‍යයේ වුවද විදේශ විනිමය ගලා ඒම් වැඩිදියුණු වීම එම තත්ත්වය පිළිබිඹු කරයි. 2025 වසරේදී අපනයන ආදායම ඓතිහාසික වශයෙන් ඉහළ මට්ටමකට ළඟා විය. කෙසේ වෙතත්, ආනයන වියදම අපනයන ආදායමට වඩා වේගයෙන් ඉහළ යාම හේතුවෙන්, විශේෂයෙන් පාරිභෝගික භාණ්ඩ සහ වාහන සඳහා වූ ඉල්ලුම ඉහළ යාම ඊට අර්ධ වශයෙන් හේතු වූ බැවින්, වෙළෙඳ හිඟය ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 7.9ක්[2] දක්වා පුළුල් විය. එමෙන්ම, විදේශගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ඇමරිකානු ඩොලර් බිලියන 8[2] ඉක්මවා ගිය අතර, එමඟින් රටට විදේශ විනිමය සැපයෙන ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ලදී. මේ අතර, 2024 වසරට සාපේක්ෂව සංචාරක ආදායම 1.6%[2]කින් ඉහළ ගිය අතර, සංචාරක පැමිණීම් 2018 වසරේ, එනම් අර්බුදයට පෙර පැවති මට්ටම්ද ඉක්මවා ගියේය. අඛණ්ඩව පැවති විදේශ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යයේ වුවද, 2025 වසර අවසානය වන විට දළ නිල සංචිත ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 6.8ක්[2] දක්වා ඉහළ ගියේය. බහුපාර්ශ්වික ආයතනවලින් ලැබුණු ලැබීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම් මගින් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් සහාය ලැබුණි. මුදල් ඒකකයේ තත්ත්වය සම්බන්ධයෙන්, 2025 වසර තුළ ශ්‍රී ලංකා රුපියල 5.6%[2]කින් අවප්‍රමාණය වූ අතර, වසර අවසානයේදී එක්සත් ජනපද ඩොලරයකට රුපියල් 309.99[2]ක අගයක් වාර්තා කළේය. මේ අතර, රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ විදේශ ආයෝජන 2024 වසරේ වාර්තා වූ ශුද්ධ පිටතට ගලා යාමට සාපේක්ෂව, 2025 වසරේදී ඇමරිකානු ඩොලර් මිලියන 248ක[2] ශුද්ධ ගලා ඒමක් වාර්තා කළේය.

වගුව 01: විදේශීය අංශයේ කාර්යසාධනය පිළිබඳ සාරාංශය

කාණ්ඩය	**2024** ඇ.ඩො.මි.	**2025** ඇ.ඩො.මි.	වෙනස **%**
භාණ්ඩ අපනයන	12,772	13,581.4	6.3
භාණ්ඩ ආනයන	18,841.4	21,479.9	14.0

වෙළඳ ශේෂය	-6,069.4	7,898.6	
විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ	6,575.4	8,076.2	22.8
සංචාරක ඉපැයීම්	3,168.6	3,219.2	1.6
ජංගම ගිණුම් ශේෂය	1,205.7	1,733.4	43.8

රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය

2025 වසරේදී ශක්තිමත් ආදායම් පදනමක් මත ක්‍රියාත්මක කළ රාජ්‍ය මූල්‍ය ශක්තිමත් කිරීමේ ක්‍රියාමාර්ගවල සහාය හේතුවෙන් රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය තවදුරටත් ශක්තිමත් විය. 2025 වසරේදී රජයේ ආදායම පෙර වසරට සාපෙක්ෂව 34.1%[2]කින් ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් බදු ආදායම ඉහළ යාම හේතු විය. මේ අතර, සමස්ත රාජ්‍ය වියදම පෙර වසරට සාපෙක්ෂව 1.6%[2]කින් සුළු වශයෙන් ඉහළ ගිය අතර, එයට ප්‍රධාන වශයෙන් වැටුප්, වේතන සහ පොලී ගෙවීම් ඉහළ යාම හේතු විය. ඒ අනුව, 2025 වසර අවසන් වන විට සමස්ත රාජ්‍ය මූල්‍ය හිඟය රුපියල් බිලියන 744.86[2]ක් දක්වා සීමා වූ අතර, රුපියල් බිලියන 1,755.81[2]ක ප්‍රාථමික අතිරික්තයක් වාර්තා විය. කෙසේ වෙතත්**,** ඩිට්වා සුළි කුණාටුවෙන් පසු ප්‍රතිසාධන කටයුතු**,** ජනතාවගේ ජීවනෝපායන් යථා තත්ත්වයට පත් කිරීම සහ හානි වූ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළු කටයුතු හේතුවෙන් රාජ්‍ය මූල්‍ය අංශය මත අතිරේක පීඩනයක් ඇති විය. ඊට ප්‍රතිචාර වශයෙන්, 2025 වසරේ ප්‍රාථමික අතිරික්තය ඇස්තමේන්තුගත මට්ටම ඉක්මවා වාර්තා වීමෙන් ලැබුණු මූල්‍ය අවකාශය උපයෝගී කර ගනිමින් රජය ඉලක්කගත සහන ක්‍රියාමාර්ග සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කළේය. මීට අමතරව, 2026 අයවැය සඳහා රුපියල් බිලියන 500ක[2] පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කරන ලද අතර, ණය ගැනීමේ සීමාව නොවෙනස්ව පවත්වා ගනිමින් එය පවතින මුදල් සංචිත භාවිතයෙන් මූල්‍යනය කිරීමට සැලසුම් කරන ලදී.

වගුව 02: රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය පිළිබඳ සාරාංශය

කාණ්ඩය / වර්ගය	2024 රු.බි.	2025 රු.බි.	වෙනස %
මුළු ආදායම	4,090.81	5,485.55	34.1%
මුළු වියදම	6,130.74	6,230.41	1.6%
ප්‍රාථමික ශේෂය	649.57	1,755.81	170.3%
සමස්ත අයවැය ශේෂය	(2,039.93)	(744.86)	-63.5%

සී.ටී.ස්මිත් මුදල් වෙළෙඳපොළ අරමුදල (ආරම්භය: 2012 පෙබරවාරි 27)

අරමුදල් කළමනාකරු

කුහන් විනයාගසුන්දරම්

අරමුදලේ අරමුණ සහ මිණුම් දර්ශක පදනම් නිර්ණායකය

මෙම අරමුදල, දින 397ක් ඇතුළත කල් පිරෙන ආයෝජන ශ්‍රේණියේ සුරැකුම්පත්වල ආයෝජනය කරන විවෘත-අන්ත ඒකක භාර අරමුදලකි. අඩු අවදානම් මට්ටමක් සහිත සුරැකුම්පත් කළඹක ආයෝජනය කිරීම මඟින් වාර්ෂික ආදායමක් ලබා දීම මෙම අරමුදලේ ආයෝජන අරමුණ වේ.

විස්තරය

2025 වර්ෂය තුළදී සී.ටී.ස්මිත් මුදල් වෙළෙඳපොළ අරමුදල විසින් සිය ආයෝජකයන් වෙත වාර්ෂිකව 7.71%ක ප්‍රතිලාභයක් ලබා දී ඇත. මෙම අරමුදල ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත් සහ ඉහළ ගුණාත්මකභාවයකින් යුත් ස්ථාවර තැන්පතු කෙරෙහි අවධානය යොමු කරයි.

අරමුදලේ ගාස්තු

කළමනාකරණ ගාස්තුව – වාර්ෂිකව 0.6%

(ශුද්ධ වත්කම් වටිනාකමේ (NAV) ප්‍රතිශතයක් ලෙස)

භාරකාර ගාස්තුව – වාර්ෂිකව 0.15%

(ශුද්ධ වත්කම් වටිනාකමේ (NAV) ප්‍රතිශතයක් ලෙස)

වගුව 03: අරමුදලේ ප්‍රතිලාභය හා මිණුම් දර්ශක පදනම් නිර්ණායකය

කාලය	CT Smith MMF	NDBIB-CRISIL 91 Day T-Bill Index	CT Smith MMF Annualized*
2025 වර්ෂයේ මේ දක්වා	7.71%	8.05%	7.71%
ආරම්භයේ සිට	293.72%	286.63%	10.40%

කාර්යසාධන දත්ත 2025 දෙසැම්බර් 31 දිනට අදාළ මාස අවසාන මිල ගණන් මත පදනම් වේ. මෙම ලේඛනයේ ඇතුළත් කාර්යසාධන දත්ත අතීත කාර්යසාධනය නිරූපණය කරන අතර, එය අනාගත ප්‍රතිඵල සඳහා කිසිදු සහතිකයක් නොවේ.

2025 වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව අනුගමනය කළ ලිහිල් මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව, රජයේ සුරැකුම්පත් සඳහා අදාළ පොලී අනුපාත ඇතුළුව වෙළෙඳපොළ පොලී අනුපාත පහළ ගොස් ඇත. සමස්තයක් ලෙස පොලී අනුපාත පහළ ගියද, වසරේ අවසන් භාගයේදී කෙටි කාලීන පොලී අනුපාතවල යම් යම් විෂමතා දක්නට ලැබුණු අතර, ඩිට්වා සුළි කුණාටු තත්ත්වය හේතුවෙන් ඇති වූ පසුකාලීන ප්‍රතිසාධන කටයුතු සඳහා රජයේ ණය ගැනීම් ඉහළ යාම ඊට හේතුව වන්නට ඇත. ඒ අනුව, 2025 දෙසැම්බර් අවසානය වන විට දින 91, දින 182 සහ දින 364 භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාත පිළිවෙළින් 7.74%[2], 8.27%[2] සහ 8.45%[2] ලෙස පැවතිණි.

වසරේ පළමු අර්ධය තුළදී, රඳවා ගැනීමේ බද්ද (WHT) වෙතින් ලැබෙන බදු නිදහස් කිරීමේ වාසිය ලබා ගනිමින් අරමුදල රජයේ සුරැකුම්පත් සඳහා සිදු කළ වෙන්කිරීම් වැඩි කළේය. පොලී අනුපාතවල පහළ යාමේ බොහෝ ගැලපීම් දැනටමත් සිදුවී ඇති අතර, උද්ධමනය මහ බැංකුවේ මධ්‍ය කාලීන 5%[2] ඉලක්කය වෙත ක්‍රමයෙන් ළඟා වෙමින් පවතින බැවින්, නුදුරු කාලීනව පොලී අනුපාත සාපේක්ෂව ස්ථාවරව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වසරේ අවසන් භාගයේදී, ආයෝජන ශ්‍රේණියේ නිර්ණායක සපුරාලන සහ WHT අඩු කිරීමෙන් පසු සාපේක්ෂව ඉහළ ප්‍රතිලාභයක් ලබා දෙන ස්ථාවර තැන්පතු සහ ස්ථාවර තැන්පතු සහ සුරැකුම්කරණ සඳහා වැඩි වශයෙන් ආයෝජනය කරන ලදී. ඒ අනුව, 2025 දෙසැම්බර් අවසානය වන විට රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතු සඳහා වූ නිරාවරණය පිළිවෙළින් 73%ක් සහ 22%ක් විය.

2025 දෙසැම්බර් 31 වන විට, අරමුදල A- සහ ඊට ඉහළ ශ්‍රේණිගත කිරීම් සහිත මූල්‍ය උපකරණවල පමණක් ආයෝජනය කර තිබූ අතර, ගෝලීය අවිනිශ්චිතතා පවතින පසුබිමක පොලී අනුපාත ඉහළ යාමෙන් ලැබිය හැකි වාසි ලබා ගැනීමේ අරමුණින්, අරමුදලේ 54%ක් මාස 3ක් ඇතුළත කල් පිරෙන ආයෝජන සඳහා යොදවා තිබිණි.

අරමුදල හා සම්බන්ධ ප්‍රධාන කරුණු

ණය ගුණාත්මකභාවය – ශුද්ධ වත්කම් වටිනාකමේ (NAV) ප්‍රතිශතයක් ලෙස





<u>වත්කම් වෙන්කිරීම</u>

<u>කල්පිරීමේ කාලසීමා – **NAV** හි ප්‍රතිශතයක් ලෙස</u>



2025 දෙසැම්බර් 31 වන විට, අරමුදලේ මුළු ශුද්ධ වත්කම් වටිනාකම රු. මිලියන 1,505.09ක් වූ අතර, අරමුදලේ ඒකක හිමියන් 360 දෙනෙකු සිටියහ. 2025 දෙසැම්බර් 31 වන දින අරමුදලේ දායකත්ව මිල සහ මුදාගැනීමේ මිල ඒකකයකට රු. 34.1893ක් විය.

මූලාශ්‍ර

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව